සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 10 ශ්‍රේණිය | සිංහල සාහිත්‍ය රසාස්වාදය I | කාලය : පැය යි. |
|---|---|---|

### I පත්‍රය

■ I වන පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයා වෙන ම භාර දෙන්න.

01. i සිට v තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. පන්සිය පනස් ජාතක පොත සම්පාදිත,

අ. යුගය ..........................................

ආ. එවක රාජ්‍ය පාලකයා නම් කරන්න. ..........................................

ii. කුස ජාතකයෙහි එන මුඛ්‍ය චරිතද්වය නම් කරන්න.

අ. ..........................................

ආ. ..........................................

iii. සිංහල පන්සිය පනස් ජාතක පොතට ආශ්‍රය වූ මුල් කෘතිය වන පාලි ජාතකට්ඨ කථාවේ කථා වස්තුවල ආකෘතියේ දක්නට ලැබෙන අංග දෙකක් ලියා දක්වන්න.

අ. ..........................................

ආ. ..........................................

iv. හර්තෘහරීන්ගේ නීතිශතකයෙහි එන ''සාහිත්‍ය සංගීත ......'' නම් 12 වන ශ්ලෝකය ලියා දක්වන්න.

..........................................

..........................................

..........................................

..........................................

v. සිංහල ජාතක පොත සකස් කළ අය අනුගමනය කළ ක්‍රමයට අදාළ ආකෘතියේ අංග දෙකක් ලියා දක්වන්න.

අ. ..........................................

ආ. ..........................................

02. පහත දැක්වෙන ගද්‍ය කොටස අදාළ කරගෙන පිළිතුරු සපයන්න.

''සැකෙවින් කිව හොත් - සාහිත්‍යය යනු ඔබගේ හදවත පෝෂණය කරන ධනයකි. උසස් සාහිත්‍යය කෘතියක් පරිශීලනයෙන් ලබන ආස්වාදය හෙවත් රසය, අධ්‍යාත්මික වූ ම ප්‍රතිලාභයකි. මුළු මහත් ලෝක සාහිත්‍යයම ආධ්‍යාත්මික ධනයක් වන්නේ එකී අරුතිනි.

උක්ත කරුණු ඇසුරෙන් වටහා ගත යුතු මූලික කාරණයක් ඇත්තේ ය. එනම්, සාහිත්‍යය පවතින්නේ වින්දනය සඳහා ම බව ය. දෙවැනි පැරකුම්බාවන්, ස්වකීය මහා කාව්‍යය වන කව්සිළුමිණ අරඹන අයුරු ඊට නිදසුන් ය.

''සරසවිය බැලුමසෙක්නි - වෙත්වා කිවි දනෝ
පෙදෙහි රසහව් විඳුනා - දෙනෙතා ඉතා දුලබෝ''

සරසවියගේ බැලුම් මාත්‍රයකින් වුව කෙනෙකු කවියෙකු වනු ඇත. එහෙත් කවියෙහි රස භාව විඳින ජනතාව නම්, ඉතා දුලබ ය.

සාහිත්‍ය නිර්මාණයක රස විඳ ගැනීම එකී නිර්මාණය බිහි කිරීමටත් වඩා අපහසු බවත් එය ඉතා වටිනා බවත් මහ කිවි පැරකුම්බාවන් විසින් පැහැදිලි කරන ලද්දේ එවන් අතිශයෝක්තියකිනි. එසේ වුව ද එය සැබෑවකි.''

i. මෙහි සාහිත්‍ය හඳුන්වා ඇත්තේ කුමක් ලෙස ද?

..........................................................................................................................................

(ල. 04 යි)

ii. මෙහි ආධ්‍යාත්මික ප්‍රතිලාභයක් ලෙස හැඳින්වෙන්නේ කුමක්ද?

..........................................................................................................................................

(ල. 04 යි)

iii. සාහිත්‍ය පවතින්නේ කිනම් කර්තව්‍යයක් සඳහා ද?

..........................................................................................................................................

(ල. 04 යි)

iv. මෙහි සඳහන් පරිදි අපහසු කාර්යයක් වන්නේ කුමක්ද?

..........................................................................................................................................

(ල. 04 යි)

v. දෙවන පැරකුම්බාවන් අතිශයෝක්තියකින් පැහැදිලි කරන ලද්දේ කිනම් කරුණක්ද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ල. 04 යි)

## II කොටස

- **1, 2, 3, 4, 5, 6 යන ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

1. 'සාහිත්‍ය' යන පදය පිළිබඳ නිරුක්තිමය (etymological) විවරණයක් සපයන්න.
2. සාහිත්‍ය රසවින්දනය යනු කුමක්දැයි විග්‍රහ කරන්න.
3. සාහිත්‍යයේ පරමාර්ථ පිළිබඳව විග්‍රහාත්මක අර්ථකථනයක් සපයන්න.
4. සිංහල පන්සිය පනස් ජාතක පොත පිළිබඳව විශ්ලේෂණාත්මකව සාකච්ඡා කරන්න.
5. ජාතක කතාවෙන් නිරූපිත මානව ජීවිත විවරණය පිළිබඳව විමර්ශනය කරන්න.
6. කුස ජාතකය පිළිබඳව සංක්ෂිප්ත හැඳින්වීමක් ඉදිරිපත් කරන්න. (ල. 15 x 4 = 50)